## 210 මිතුරනට වගේ

මිතුරනට වගේ සතුරනට ඔබේ පෙම් කරන්න
එයයි දේව දරුකමේ අගේ //

දමිටු අයට මෙන් අදමිටු දනට දෙව්පියා
උදා කරන සැටි හිරු සඳු බලව් නෙත් අයා
සුදනන් හා දුදන අතර වෙනසක් නොතකා
වැසි පල දෙන සැටි සලකව් සමව පා දයා

හිතැති අයට දයා ගුණය පෑම පහසුවේ
කව්රුනට ද කළහැකි ඒ අරුමයක් නොවේ
පෙම් කිරීම ඔබට වෛර කරන අය කෙරේ
උසස් මිනිස් ගුණයකි ඉන් විපුල පල ලැබේ

සතුරන් හට සාප නොකර සිටිනු එය අගේ
පතනු ඉත සිතින් වෙනසක් ඔවුන් දිවි මගේ
දැහැමියාව රජ යන්නට ඔවුන් හද ගැබේ
යදිනු මැනවි දෙව් සමිඳුන් සැනසුමක් ලැබේ

ලබනු පිණිසැ තුති පැසසුම් දන් දෙනු නොවටී
ගරු බුහුමන් ලබනුව සිල් රැකුම ද නොහොබී
සුරතින් දෙන දෙය වමතට හඟවනු නොසරි
රහසිගතවූ පින් දහමේ අනුසස් බෙහෙවී

ගැලවුම්කරු ජේසු තුමා කුරුසිය මතදී
සතුරනට පවා දෙව්ඳුන් කමාව අයැදී
දකුණෙහි හුන් සොරා වරද පිළිගත් විටදී
ගිව්සූ සැටි සග සැප ඔහු හට පෙම් බස්දී

අසීමිතයැ මහ ගුණ කඳ දෙව් සමිඳුන්ගේ
අසීමිතයැ අප වෙත පෑ පෙම එතුමන්ගේ
ඒ නිසාමැ දෙව්පිය දරු කැළ වන අපගේ
යහ ගුණ දම් සීමාකොට නොතැබිය යුතුවේ